සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

1659

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 8 ශ්‍රේණිය

ඉතිහාසය I - II

කාලය / நேரம் / Time: පැය 2 යි

නම / பெயர் / Name ........................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. අනුරාධපුරයේ තිසා වැව තනවන ලද රජතුමා කවුරුන් ද?

(1) පණ්ඩුකාභය (2) මහසෙන් (3) වසභ (4) දේවානම්පියතිස්ස

02. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට උඩරට පාලකයා වූයේ

(1) ජයවීර බණ්ඩාර ය (2) සේනාසම්මත වික්‍රමබාහු ය
(3) කරලියද්දේ බණ්ඩාර ය (4) විමලධර්මසූරිය ය

03. යුරෝපය හා ආසියාව අතර පැවති ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය කුමක් ද?

(1) වැනිසිය (2) කොන්ස්තන්තිනෝපලය
(3) රෝමය (4) ජිනෝවා

04. ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය කුමක් ද?

(1) කැලිකට් (2) පොන්ඩිචෙරි (3) බතාවිය (4) කොළඹ

05. පෘතුගීසීන් ලංකාවට පැමිණීමට පෙර ඉන්දියාවට පැමිණි පෘතුගීසි නාවිකයා කවුරුන්ද?

(1) ෆැරැන්සිස්කෝ ද අල්මේදා (2) වස්කෝද ගාමා
(3) ලොරෙන්සෝද අල්මේදා (4) ජෙරනිමෝද අසවේදු

- **06 ප්‍රශ්නයේ සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන තුළ ලියන්න.**

06. පළමුවන අග්බෝ රජතුමා මහවැලි ගඟේ සිට ජලය ගෙනයාමට .............................. ඇළ තනවන ලදී.
(යෝධ / අංගමැඩිල්ල / මිනිපේ)

07. උඩරට රාජධානියේ නායක්කර් වංශයේ ආරම්භක පාලකයා .............................................. රජු ය.
(කීර්ති ශ්‍රී රජසිංහ/ ශ්‍රී විජය රාජසිංහ / රාජාධිරාජසිංහ)

08. මධ්‍යතන යුගයේ අවසානයේ යුරෝපයේ ඉදි වූ ඔක්ස්පර්ඩ්"කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල.................. පිහිටා ඇත.
(ප්‍රංශයේ / ඉතාලියේ / එංගලන්තයේ)

09. අප්‍රිකාවේ කුණාටු තුඩුව" සුබපැතීමේ තුඩුව ලෙස නම් කලේ ................ රජු ය. (පෘතුගාල / ස්පාඤ්ඤ / ප්‍රංශ)

10. මෙරට සමාජයට බයිලා. කපිරිඤ්ඤා වැනි සංගීත අංග එක් වූයේ ....................... පාලන සමයේදී ය.
(ලන්දේසි /ඉංග්‍රීසි / පෘතුගීසි)

✷ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.

11. දිවයිනේ මුල්වරට උයනක් තනවන ලද්දේ මුටසීව රජතුමා විසිනි. ( )

12. පළමුවන විමලධර්මසූරිය රජු නීත්‍යානුකූල රාජ්‍ය උරුමය තහවුරුකර ගත්තේ දෝන කතරිනා කුමරිය විවාහ කර ගැනීමෙනි. ( )

13. පුනරුද සමයේ කලා ශිල්ප ආගමික මුහුණුවරක් ගැනීම විශේෂ ලක්ෂණයකි. ( )

14. මැගලන්ගේ මුහුදු ගමන නිසා ලෝකය ගෝලාකාර බව තහවුරු විය. ( )

15. සීතාවක රාජධානියේ මුල් ම පාලකයා පළමුවන රාජසිංහ රජු ය. ( )

✷ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

16. අතීතයේ සිට ම මෙරට මැටි භාජන තැනීමේ දී .......................................... නම් උපකරණය භාවිතා කර ඇත.

17. දළදා මාලිගයට චිත්තාකර්ෂණීය පත්තිරිප්පුව එක් කළේ .......................................... රජතුමා විසිනි.

18. යුරෝපයේ පුනරුද සමයේ බිහි වූ දක්ෂ චිත්‍ර ශිල්පියෙකු වූ .......................................... විසින් මොනාලිසා නම් චිත්‍රය නිර්මාණය කරන ලදී.

19. යුරෝපීන් පෙරදිගට පැමිණීමට පෙර .......................................... නම් පාලකයෙකු යටතේ ක්‍රිස්තියානි රාජ්‍යයක් ඇතැයි මිත්‍යා විශ්වාසයක් පැවතිනි.


20. ආසියාවේ පෘතුගීසීන් සතු ප්‍රදේශ පාලන මධ්‍යස්ථානය ඉන්දියාවේ .......................................... හි පිහිටා තිබුණි.

II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. අ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ දක්වා ඇති අක්ෂර වලට අදාළ නම් පහත ලැයිස්තුවෙන් තෝරා පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. මහනුවර
2. ත්‍රිකුණාමලය
3. කල්පිටිය
4. ගාල්ල
5. කොළඹ
6. මඩකලපුව




(ල : 6)


ආ)



i. A රූපයේ දැක්වෙන රජතුමාගේ නම කුමක්ද?
ii. ඔහු රජවීමට පෙර හැඳින් වූ නම කුමක්ද?
iii. මොහු පාලනය කළ රාජධානිය කුමක්ද?

(ල : 3)

ඇ)



B

i. B රූපයේ දැක්වෙන්නේ කුමක්ද?
ii. මෙය කුමන රාජධානි සමයට අයත්ද?
iii. මෙය ඉදිකර ඇත්තේ කුමක් සඳහාද?

(ල : 3)

02. i. අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ඇළ මාර්ග තුනක් නම් කරන්න. (ල : 3)

ii. ඇළවල් තැනවීමේ අවශ්‍යතා දෙකක් ලියන්න. (ල : 4)

iii. පැරණි ලාංකීකයන් පොකුණු තැනවීමේ දී භාවිතා කළ තාක්ෂණික උපක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල : 5)

03. i. රජරට ශිෂ්ටාචාර සමයේ මහවැව් ඉදිකරන ලද රජවරු තිදෙනෙක් නම් කරන්න. (ල : 3)

ii. මහවැව් තැනවීමේ අරමුණු දෙකක් ලියන්න. (ල : 4)

iii. වැවක ප්‍රධාන අංග දෙකක් නම් කර ඒවායින් ඉටුවන කාර්‍යයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල : 5)

04. i. මහනුවර රාජධානිය හැඳින්වූ වෙනත් නම් තුනක් ලියන්න. (ල : 3)

ii. පහත A,B,C,D ප්‍රකාශ වල නිවැරදි පිළිතුර ලියා දක්වන්න.

A. උඩරට රාජධානියේ ආරම්භක පාලකයා

B. දොන් ජුවන් නමින් බෞතිස්ම ලැබූ කුමාරයා

C. ලන්දේසින්ගේ සහය ඇතිව පෘතුගීසින් මෙරටින් පළවා හැරීමට මුල් වූ රජතුමා

D. බුදු දහමට විශාල සේවයක් කළ නායක්කර් වංශික රජතුමා (ල : 4)

iii. A. මහනුවර රාජධානි සමයේ ආර්ථික රටාව තුළ පැවති ප්‍රධාන අංශ තුන නම් කරන්න.

B. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න (ල : 5)

05. i. පුනරුද සමයේ ඉතාලියේ දියුණු වූ වෙළෙඳ නගර තුන නම් කරන්න. (ල : 3)

ii. පුනරුද සමයේ කලා ශිල්ප වල ලක්ෂණ දෙකක් ලියන්න. (ල : 4)

iii. A. පුනරුද සමයේ පහත නම් සඳහන් පුද්ගලයන් දෙදෙනා ඉදිරිපත් කළ නව මතවාද නම් කරන්න.

1. නිකලස් කොපර්නිකස්
2. ජොහැන්නස් කෙප්ලර්

B. මින් එක් පුද්ගලයෙක් ඉදිරිපත් කළ මත වාදයක් විස්තර කරන්න. (ල : 5)

06. i. පුනරුද සමයේ දේශගවේෂණ කටයුතු වල නිරත වූ යුරෝපීය රටවල් තුනක් සඳහන් කරන්න. (ල : 3)

ii. දේශ ගවේෂණ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල : 4)

iii. A. පහත සඳහන් දේශ ගවේෂකයන් සොයාගත් ප්‍රදේශ නම් කරන්න.

1. බර්තෝලමියු ඩයස්
2. කැබේ සහෝදරයෝ
3. ක්‍රිස්ටෝපර් කොලොම්බස්

B. යුරෝපීයන් ආසියාව ට පැමිණීමේ අරමුණු දෙකක් ලියන්න. (ල : 5)

07. i. විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදීගිය කොටස් තුන නම් කරන්න. (ල : 3)

ii. A. පෘතුගීසින් විසින් උඩරට ට එල්ලකරන ලද ආක්‍රමණ දෙකක් සඳහන් කරන්න.

B. එම ආක්‍රමණ පරාජයට පත් කළ උඩරට රජවරු දෙදෙනාගේ නම් ලියන්න. (ල : 4)

iii. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ල : 5)